# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 13,335 — 1962 ඔක්තෝබර් 5 වැනි සිකුරාද — 1962.10.5**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොද ඇත.)


| | පිට |
|---|---|
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන ප්‍රකාශන ආදිය ... ... | — |
| අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත් කිරීම් ආදිය ... | 1407 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 1407 |
| අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | 1408 |
| වෙනත් පත් කිරීම් ආදිය ... ... ... | 1409 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1409 |
| මිළ පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | — |
| ආණ්ඩුවේ වත් කම් හා බැරකම් ප්‍රකාශ ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... | 1412 |
| "සුරාබද්ද ආඥාපනත" පිළිබඳ දැන්වීම් ... ... | — |


## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 412**

අංකය: ඩී. 42/රෙක් ව්.

**නිලධාරීන් පත් කිරීම්—රාජකීය ලංකා නාවික හමුදාව**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් රාජකීය ලංකා නාවික හමුදාවේ පහත සඳහන් පත් කිරීම අනුමත කර තිබේ :—

**1962 සැප්තැම්බර් මස 15 වැනි දින සිට රා. ව. ලං. පරාක්‍රම නෞකාවේ අණදෙන නිලධාරි වශයෙන්—**

ලයිතන් කොමාන්ඩර් ජේ. ඒ. රත්නායක, රා. ලං. නා. හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

මො. වී. ජේ. අ. අබයකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩබලන සථිර ලේකම්.

1962 සැප්තැම්බර් 21 වෙනිදා,
කොළඹ දීය.

10-49/1

---

**1962 අංක 413**

අංකය: ඩී. 42/රෙක් ව්.

**නිලධාරීන් පත් කිරීම්—රාජකීය ලංකා නාවික හමුදාව**

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ විසින් රාජකීය ලංකා නාවික හමුදාවේ පහත සඳහන් පත් කිරීම අනුමත කර තිබේ :—

**1962 සැප්තැම්බර් මස 6 වැනි දින සිට රා. ව්. ලං. සේරුවා නෞකාවේ අණදෙන නිලධාරි වශයෙන්—**

උප ලයිතන් ඇල්. ආර්. රාජසිංහම්, රා. ලං. නා. හ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

මො. වී. ජේ. අ. අබයකෝන්,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ
වැඩබලන සථිර ලේකම්.

1962 සැප්තැම්බර් 21 වෙනිදා,
කොළඹ දීය.

10-49/2

## රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 414**

ඒ. 133/62.

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ලංකා සිවිල් සේවයේ තුන් වැනි පෙලේ පහත සඳහන් නිලධාරීන් 1962 සැප්තැම්බර් මස 8 වැනි දින සිට ලංකා සිවිල් සේවයේ දෙවැනි පෙළට උසස් කර ඇත :—

1. එස්. එස්. සිල්වා මහතා
2. එස්. පී. නානායක්කාර මහතා
3. ඒ. බී. සමරජීව මහතා

එන්. පී. විජයරත්න,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 ඔක්තෝබර් මස 1 වෙනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍යාලයේ දීය.
නැ. පෙ. 500.

10-154/1

---

**1962 අංක 415**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පහත සඳහන් පත් කිරීම් කරන ලෙස නියමකර ඇත්තේ ය :—

ඒ. 8/62.

1962 පෙබරවාරි මස 19 වැනි දින සිට අධිනීතිඥ ඊ. ඩී. වික්‍රමනායක මහතා ඇටෝර්නි ජනරාල් දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥ වරයකු වශයෙන්.

1962 පෙබරවාරි මස 28 වැනි දින සිට අධිනීතිඥ ජේ. ඒ. ඩී. ද සිල්වා මහතා ඇටෝර්නි ජනරාල් දෙපාර්තමේන්තුවේ රජයේ අධිනීතිඥ වරයකු වශයෙන්.

එන්. පී. විජයරත්න,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 ඔක්තෝබර් මස 1 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්‍යාලයේ දීය.
නැ. පෙ. 500.

10-154/2

# අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් කරන පත්කිරීම් ආදිය

**1962 අංක 416**

අධිකරණ සේවා කොමිෂන් සභාවෙන් පහත සඳහන් පත්කිරීම් කර ඇත්තේ ය:—

අංකය: ජේඒ. 11/48.

ඕ. එල්. ද ක්‍රෙට්සර් මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 සැප්තැම්බර් 27 වැනි දින සිට, කොළඹ දිස්ත්‍රික් උසාවියේ අංක 9075/පී දරණ නඩුව අවසාන වන තුරු ඇහීමට හා තීන්දුව දීමට, කොළඹ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඒ. 25/48.

වී. එම්. කුමාරසාමි මහතා ඔහුගේ වෙනත් රාජකාරිවලට අතිරේක වශයෙන් 1962 සැප්තැම්බර් 29 වැනි දින සිට, යාපනේ මහෙස්ත්‍රාත් උසාවියේ අංක 23189, 18912 සහ 23897 දරණ නඩු අවසාන වන තුරු ඇහීමට හා තීන්දු දීමට, යාපනේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා යාපනේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑල්. 40ඒ/60 (ඒ).

සී. එල්. ටී. මූනමලේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එම්. ඒ. වික්‍රමසූරිය මහතා 1962 ඔක්තෝබර් 20 වැනි දින, තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය: ජේඑල්. 40ඒ/60.

සී. එල්. ටී. මූනමලේ මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. අමරසිංහ මහතා 1962 ඔක්තෝබර් 19 වැනි දින සිට 24 වැනි දින දක්වා හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑල්. 57ඒ/57.

කේ. ඩී. ඕ. එස්. එම්. සෙනෙවිරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ඩබ්ලිව්. ආර්. ද සිල්වා මහතා 1962 සැප්තැම්බර් 20 වැනි දින සිට 24 වැනි දින දක්වා, ගම්පොල පිහිටි උසාවියේ ක්‍රියා කරන පිණිස, මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය: ජේඑල්. 40ඒ/60.

කේ. සී. ටී. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. අමරසිංහ මහතා 1962 ඔක්තෝබර් 11 වැනි දින, තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය: ජේඑල්. 63ඒ/58.

ජේ. ජී. එල්. සවාරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. ජී. ද සිල්වා මහතා 1962 සැප්තැම්බර් 29 වැනි දින හා 1962 ඔක්තෝබර් 1 වැනි දින සිට 6 වැනි දින දක්වා අවිස්සාවේල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා අවිස්සාවේල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑල්. 48ඒ/60.

කේ. සී. ටී. ද අල්විස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. එම්. ඒ. වික්‍රමසූරිය මහතා 1962 ඔක්තෝබර් 11 වැනි දින සිට 14 වැනි දින දක්වා, තංගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, තංගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා හම්බන්තොට අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය: ජේඑල්. 31ඒ/62.

එස්. ජෝකනාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, කේ. රත්නසිංහම් මහතා 1962 ඔක්තෝබර් 6 වැනි දින සිට 9 වැනි දින දක්වා, පේදුරුතුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, හා පේදුරුතුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑල්. 31බී/62.

එස්. ජෝකනාදන් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. කනගසබේ මහතා 1962 ඔක්තෝබර් 5 වැනි දින, පේදුරුතුඩුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා පේදුරුතුඩුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑල්. 51ඒ/55.

ටී. ජේ. රාජරත්නම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. එච්. උඩලෑගම මහතා 1962 සැප්තැම්බර් 27 වැනි හා 28 වැනි දිනයන්හි, කෑගල්ලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා කෑගල්ලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑල්. 8බී/57.

බී. ඊ. ද සිල්වා මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. එන්. බර්තෝලමියුස් මහතා 1962 සැප්තැම්බර් 25 වැනි දින සිට 1962 ඔක්තෝබර් 1 වැනි දින දක්වා, නුවරඑළියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, නුවරඑළියේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, නුවරඑළියේ අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට හා බදුල්ල-හල්දුම්මුල්ල අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය: ජේඑල්. 48/48 (ඒ).

ඒ. එස්. පොන්නම්බලම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, සී. ඒ. එල්. කොරෙයා මහතා 1962 සැප්තැම්බර් 24 වැනි දින, හලාවත අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හලාවත අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට, හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය: ජේඑල්. 48/48.

ඒ. එස්. පොන්නම්බලම් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එස්. එම්. එම්. කාසිම් මහතා 1962 සැප්තැම්බර් 25 වැනි දින, හලාවත අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හලාවත අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, පුත්තලමේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා පුත්තලමේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය: ජේඑල්. 17සී/62.

ජේ. ජේ. එෆ්. ඒ. ඩයස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එන්. කුමාරසාමි මහතා 1962 ඔක්තෝබර් 4 වැනි දින, මහනුවර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මහනුවර අතිරේක නාගරික මහෙස්ත්‍රාත් ධුරයට, දුම්බර අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට හා මහනුවර අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට.

අංකය: ජේඑල්. 6ඒ/48.

බී. ජී. එස්. ඩේවිඩ් මහතා නැවත වැඩ බාරගන්නා තුරු හෝ නැවත නියමයක් කරන තුරු, ජේ. ජේ. ඩේවිඩ් මහතා 1962 සැප්තැම්බර් 28 වැනි දින සිට, මඩකලපුවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා මඩකලපුවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය: ජේඑල්. 34බී/48.

එස්. එස්. කුලතිලක මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, පී. ආසීර්වාදම් මහතා 1962 සැප්තැම්බර් 28 වැනි හා 29 වැනි දිනයන්හි, රත්නපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, හා රත්නපුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට.

අංකය: ජේඑල්. 68සී/62.

සී. වී. උඩලාගම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එච්. ඒ. ජයවික්‍රම මහතා 1962 සැප්තැම්බර් 30 වැනි දින සිට 1962 ඔක්තෝබර් 7 වැනි දින දක්වා, අනුරාධපුරේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, අනුරාධපුරේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට හා අතිරේක රික්වැස්ට් කොමසාරිස් ධුරයට, මන්නාරමේ හා වවුනියාවේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට, වවුනියාවේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට ත්‍රිකුණාමලේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර ධුරයට හා ත්‍රිකුණාමලේ අතිරේක මහෙස්ත්‍රාත් ධුරයට.

අංකය: පීඑල්/ටී. 6/51.

එස්. ජී. පීරිස් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. වික්‍රමතුංග මහතා 1962 සැප්තැම්බර් 24 වැනි දින, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරලේ ගම්බද උසාවි සභාපති ධුරයේ හා වැලිගම් කෝරලේ හා ගඟබොඩ පත්තුවේ ගම්බද උසාවි අතිරේක සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/එච්. 6/61.

පී. බී. හේරත් මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, වී. පී. අබේවික්‍රම මහතා 1962 සැප්තැම්බර් 22 වැනි දින, බදුල්ල දිස්ත්‍රික්කයේ, උඩුකිඳ සහ වැල්ලවායේ ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

අංකය : පීඑල්/ඩී. 7/59.

එස්. ධර්මදාස මෙනෙවිය නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු බී. එල්. අබේරත්න මහතා 1962 සැප්තැම්බර් 25 වැනි දින, රත්නපුර දිස්ත්‍රික්කයේ, කඩවත, මැද සහ නවදුන් කෝරලයන්හි ගම්බද උසාවි සභාපති ධුරයේ වැඩ බැලීමට.

ඇන්. ඒ. ද ඇස්. විජේසේකර,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1962 සැප්තැම්බර් 27 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කායනීලය,
තැ. පෙ. අංකය : 573,
කොළඹ 12.

10-96

---

## වෙනත් පත් කිරීම් ආදිය

1962 අංක 417

මගේ අංක. ඒ. අයි. 6/2.

20 වෙනි පරිච්ඡේදය වන ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වෙනි වගන්තිය යටතේ වැඩබලන ගරු අධිකරණ ඇමතිතුමා විසින්—

1962 සැප්තැම්බර් මස 19 වෙනි දින සිට, ගාළු දිස්ත්‍රික්කයේ බට හිර බෙන්තර වලල්ලාවිට කෝරලයේ වැලිතර, කොස්ගොඩ, ඌරගහ විද්‍යා ආරච්චි කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ඒ. ඩී. එන්. ද ඉසෙඩ් ජයතිලක මහතා ද,

1962 සැප්තැම්බර් මස 19 වෙනි දින සිට ස්ථිර පත්කිරීමක් කරන තුරු, ගාළු දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, මාදම්පේ, අම්බලන්ගොඩ බලපිටිය කරන්දෙනිය විද්‍යා ආරච්චි කොට්ඨාශවල හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට, ඒ. ඩී. එන්. ද ඉසෙඩ් ජයතිලක මහතා ද,

අංක. අයිඑන්ක්‍යුඑල්/6/2/57.

1962 සැප්තැම්බර් මස 4 වෙනි දින සිට ජේ. ඩබ්ලිව්. සිරිවර්ධන මහතා නැවත වැඩ බාරගන්නාතුරු, ගාළු දිස්ත්‍රික්කයේ, බෙන්තර වලල්ලාවිට කෝරළේ වේරගොඩ, බටපොල, තොටගමුව යන විද්‍යා ආරච්චි කොට්ඨාශවල, හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට ජේ. පී. ගුරුසිංහ මහතාද,

අංක අයිඑන් ක්‍යුඑල්. 8/1/62.

1962 අගෝස්තු මස 29 වෙනි දින සිට ඩී. වී. හෙට්ටිආරච්චි මහතා නැවත වැඩ භාරගන්නා තුරු, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඉහළ බෙලිගල්ලේ ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට විල්මට් ගුණරත්න මහතාද

අංක. අයිඑන් ක්‍යුඑල්. 11/8/57.

1962 සැප්තැම්බර් මස 3 වෙනි දින සිට එස්. අරුලප්පු ඩයස් මහතා නැවත වැඩ භාරගන්නාතුරු මන්නාරම් දිස්ත්‍රික්කයේ මරිච්චිකට්ටු ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට ඒ. ජර්නවාස් ඩයස් මහතාද,

අංක. අයිඑන් ක්‍යු/එල්. 11/1/58.

1962 සැප්තැම්බර් මස 24 වෙනි දින සිට සී. ඇලෙක්සැන්ඩර් මහතා නැවත වැඩභාරගන්නාතුරු මන්නාරම් දිස්ත්‍රික්කයේ පල්ලිමුනෙයි ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයේ වැඩ බැලීමට, ආර්. එස්. ලසාරුස් මහතාද,

පත්කර ඇත්තේය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන.
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
ස්ථිර ලේකම්.

1962 සැප්තැම්බර් මස 29 දින,
කොළඹ අධිකරණ අමාත්‍යාංශයේදීය.

10-197

1962 අංක 418

අංකය. ඒ. සී. (විවිධ)2/59.

අග්‍රාණ්ඩුකාර උතුමාණන් වහන්සේ ගරු අධිකරණ අමාත්‍යවරයා කෙරෙහි පවරා ඇති බලතල අනුව එතුමා විසින්—

(1) ඩී. එම්. ජයතිලක මහතා කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(2) පී. ඒ. ඕ. පී. විජේසිංහ මහතා කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් ධුරය දරණ කාලය තුල කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(3) කේ. ඒ. එන්. කේ. විජයවර්ධන මහතා මහනුවර ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් ලේකම් ධුරය දරණ කාලය තුල මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(4) පී. ඩී. කුලසේන මහතා කලුතර ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් ලේකම් ධුරය දරණ කාලය තුළ කලුතර අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන්ද,

(5) සී. එච්. ගුණවර්ධන මහතා අම්පාරේ අතිරේක දිස්ත්‍රික් ලේකම් ධුරය දරණ කාලය තුල මඩකලපු අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

(6) ඩබ්ලිව්. එම්. කේ. බී. වීරසේකර මහතා පුත්තලමේ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් ලේකම් ධුරය දරණ කාලය තුල පුත්තලම අධිකරණ දිස්ත්‍රික්කය වෙනුවෙන් සමාදාන විනිශ්චයකරුවකු වශයෙන් ද,

පත්කර ඇත්තේ ය.

ඩී. ජේ. ආර්. ගුණවර්ධන,
අධිකරණ අමාත්‍යාංශයේ වැඩබලන
ස්ථිර ලේකම්.

1962, ඔක්තෝබර් මස 1 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේදීය.

10-198

---

## ආණ්ඩුවේ නිවේදන

අංකය : 545 ඊ. 292/21. ඩීඩී.

මෙහි පහත නියමිත තනතුර දරන්නා 1960.3.15 දින සිට විශ්‍රාම වැටුප්වලට හිමිකම් ඇත්තකු බව, විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 2 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් දන්වනු ලැබේ.

### තැපැල් හා විදුලි සංදේශ සේවාව

**කළමනාකරු, විදේශ විදුලි සංදේශ ඉස්වය**

(1961 අගෝස්තු 18 දින අංක 12,609 දරන රජයේ ගැසට් පත්‍රයේ පළ වූ අංක 543 ඊ.141/ඩී හා 61.8.7 දිනත් දරන දන්වීම, විදේශ විදුලි සංදේශ සේවයේ කළමනාකරු තනතුර සම්බන්ධයෙන් ප්‍රමණක්, මෙයින් අවලංගු කරන බව වැඩි දුරටත් දන්වනු ලැබේ.)

හෙ. ජිනදාස,
වැඩ බලන භා/ලේ.

1962 සැප්තැම්බර් මස 14 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

10-8

භාණ්ඩාගාරයේ අංකය : පීඑන්137/62 (බී)

පහත සඳහන් සේවය ද්විතීයනය කරණ ලද නිලධාරීන්ගේ තාවකාලික වෘත්තීන්හි සේවා කාලය විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවේ 24 වන වගන්තියේ කොන්දේසි අනුව විශ්‍රාම වැටුප් කටයුතු සඳහා ගණන් ගැනීමට අනුමත කරණ බව මෙයින් නිවේදනය කරමි :—

| අංකය | නම | විශ්‍රාම වැටුප් සහිත පත්වීම | ද්විතීයනය කළ තනතුර |
|---|---|---|---|
| 1 | ඒ. ඒ. ගුණරත්න මහතා | කණිෂ්ඨ පරිපාලක (වඩු කර්මාන්ත) | ෆෝර්මන් (වඩු කර්මාන්ත) |
| 2 | ඇස්. ඇස්. සී. ද සිල්වා මහතා | ධීවර පරීක්ෂක | මෝදර ධීවර කර්මාන්ත ශාලාවේ සහකාර පරිපාලක. |
| 3 | ඊ. සී. පී. රණසිංහ මහතා | සැලසුම්කරු I පෙළ, ර. වැ. දෙ. | විශ්ව විද්‍යාල සහ යුද කඳවුරු නිර්මාන ශිල්පී කාර්යාලයේ සේවය සඳහා. |
| 4 | ජී. කරුණාතිලක මහතා | සා. පෙ. ලිපිකරු | දෙවෙනි ශ්‍රෙණියේ තැපැල්ස්ථානාධිපති හා සංඥදායක (තාවකාලික) |
| 5 | එම්. ඒ. ඩේවිඩ් මහතා | එම | එම |
| 6 | බී. එම්. සුමනපාල මහතා | එම | එම |
| 7 | ඊ. කේ. හේමසිරි මහතා | එම | එම |
| 8 | ඩබ්ලිව්. ඥාණපාල මහතා | එම | එම |
| 9 | එම්. ජී. පියසේන මහතා | එම | එම |
| 10 | ඒ. ඩී. සෝමපාල මහතා | එම | එම |
| 11 | වයි. එච්. විමලධර්ම මහතා | එම | එම |
| 12 | එස්. මල්ලවාරච්චි මහතා | එම | එම |
| 13 | ඒ. එම්. ටිකිරිබණ්ඩා මහතා | එම | එම |
| 14 | කේ. පියදාස මහතා | එම | එම |
| 15 | එස්. පී. විජේදාස මහතා | එම | එම |
| 16 | පී. වේලායුදම් පිල්ලේ මහතා | එම | එම |
| 17 | එච්. කලුබණ්ඩා මහතා | එම | එම |
| 18 | ජී. එච්. ජෝන් තාසන් මහතා | රාත්‍රි ටැලිෆෝන් සේවක | එම |
| 19 | ඩී. එස්. විතානච්චි මහතා | විදුලි පණිවුඩකරු | එම |
| 20 | ආර්. විමලසූරිය මහතා | රෑ ටැලිෆෝන් සේවක | එම |
| 21 | ඩී. ඩබ්ලිව්. ඇස්. පී. යාපා මහතා | එම | එම |
| 22 | වී. ඊ. නාගලිංගම් මහතා | විදුලි පණිවුඩකරු | එම |
| 23 | ඩී. අත්තනායක මහතා | එම | එම |
| 24 | එම්. නල්ලසේකරටම්පිල්ල මහතා | පියුන් | එම |
| 25 | එම්. ගුණසේකර මහතා | රනර් | දෙවෙනි ශ්‍රෙණියේ තැපැල් ස්ථානාධිපති හා සංඥදායක (තාවකාලික) |
| 26 | පී. කාම්බිමුත්තු මහතා | විදුලි පණිවිඩකරු | එම |
| 27 | ඇස්. වීරසිංහ මහතා | රාත්‍රි ටැලිෆෝන් සේවක | එම |
| 28 | ඩබ්ලිව්. කුමාරගේ මහතා | එම | එම |
| 29 | පී. කේ. ගුණපාල මහතා | තැපැල් සහායක | එම |
| 30 | යූ. ආර්. බී. විල්ප්‍රඩ් මහතා | උපාධිධාරී භාෂා පරිවර්තක | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව යටතේ සේවය සඳහා |
| 31 | ඩී. කේ. පී. බාලසූරිය මහතා | ලිපිකරු—වී. ලි. ප. I ශ්‍රෙණිය | එම |
| 32 | එච්. එල්. ඩබ්ලිව්. දිසානායක මහතා | ලඝු ලේඛක (ඉහළ ශ්‍රෙණිය) | එම |
| 33 | කේ. ජී. ජයවර්ධන මහතා | ලඝු ලේඛක (පහළ ශ්‍රෙණිය) | එම |
| 34 | ඩබ්ලිව්. ඩී. ප්‍රනාන්දු මහතා | එම | එම |
| 35 | ඩබ්ලිව්. ඩබ්ලිව්. ප්‍රනාන්දු මහතා | යතුරු ලේඛක | එම |
| 36 | බී. ඩී. ආර්. පීරිස් මහතා | එම | එම |
| 37 | ජී. අයි. පී. ගේ මහතා | අර්ධ ලිපිකරු | එම |
| 38 | ඩබ්ලිව්. ඩබ්ලිව්. එස්. එම්. ප්‍රනාන්දු මහතා | ලඝු ලේඛක (ඉහළ ශ්‍රෙණිය) | එම |
| 39 | ඩබ්ලිව්. ඒ. ටී. අල්විස් මහතා | සරජ් | පොල් පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවේ සේවය සඳහා |

අංක 13,122 හා 1962 මැයි 17 දින දරණ රජයේ ගැසට් පත්‍රයේ පළවූ, රජයේ නිතිඥ එල්. එම්. පී. පී. වීරසිංහ මහතාගේ සහ ඊ. ආර්. ද ෆොන්සේකා මහතාගේ ද්විතීයනය කිරීම මෙයින් අවලංගු කරමි.

සී. බාලසිංහම්.
වැඩ බලන භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

මහා භාණ්ඩාගාරය,
1962 සැප්තැම්බර් 25 දින.

10—43

## 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පනත

### 20 (1) වෙනි වගන්තිය යටතේ කරන නියෝගය

කම්කරුවන් හා ජනසතු සේවාවන් පිළිබඳ අමාත්‍ය ධුරන්ධර මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම 1961කේ 22 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන (සංශෝධන) පණතෙන් සංශෝධිත 1957තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 20 (1) වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල පිට, මෙහි පහත පෙනෙන උප ලේඛනයෙහි විස්තර දක්වා ඇති නිශ්චල දේපළ 1962 ඔක්තෝබර මස 10 වෙනි දින සිට මේ නියෝගය අනුව ලංකා ගමනාගමන මණ්ඩලය වෙත පවරමි.

ඇම්. පී. ද ඉසැඩ් සිරිවර්ධන,
කම්කරුවන් හා ජනසතු සේවා පිළිබඳ අමාත්‍ය තැන.

1962කේ සැප්තැම්බර මස 21 වෙනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

| දේපළ | පිහිටීම හා සෙසු විස්තර |
|---|---|
| සීමාසහිත මාතලේ බස්රථ සමාගම විසින් පාවිච්චි කරන ලද දේපල | |
| ප්‍රමාණයෙන් පර්චස් 20ක් පමණ වූ පටපිලිකන් ද පහලකැල්ල නමැති ඉඩම සහ එහි පිහිටි සියළු ගොඩනැගිලි ආදිය. | පොලොන්නරු දිස්ත්‍රික්කයේ මින්නේරිය නම් ගමේ, උතුරට, නැගෙනහිරට සහ දකුණට එම ඉඩමේ ඉතිරි කොටසය, බස්නාහිරට හබරන සිට පොලොන්නරුවට යන මහ පාරය, යන මේ මායිම් තුල පිහිටා තිබේ. |

10-1053

---

## ඉන්දියානු ආගාමික කම්කරු මණ්ඩලය

ගරු කම්කරු හා ජනසතුසේවා ඇමතිතුමා විසින් (III වන පරිච්ඡෙදය වන) ඉන්දියානු ආගාමික කම්කරු ආඥ පනතේ 9 (1) වන වගන්තිය යටතේ 1962. 9. 7 වන දින සිට තුන් වර්‍ෂයක කාල සීමාවක් ඉන්දියානු ආගාමික කම්කරු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් සේවය කිරීම සඳහා එන්. එච්. ඩබ්ලිව්. ඩලින් මහතා පත් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ඇස්. ඇම්. ද මැල්,
සථිර ලේකම්,
කම්කරු සහ ජනසතුසේවා අමාත්‍යාංශය.

1962. 9. 25.

10-64

---

## පඩිපාලක සභා ආඥපනත

### නිවේදනයයි

මිණිරන් කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයන් හැටියට 1962 මැයි 17 වැනි දින සිට අවුරුදු තුනක කාලයක් තුල පෙනී සිටීමට (136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥපනතේ 9 වන වගන්තිය යටතේ කම්කරු හා ජනසතු සේවා ගරු ඇමතිතුමන් විසින් පහත නම් සඳහන් තැනැත්තන් පත් කරන ලද බව 1943 පඩිපාලක සභා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ 26 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

වී. ඇස්. ඇම්. ද මෙල්,
කම්කරු හා ජනසතුසේවා අමාත්‍යාංශයේ
ස්ථිර ලේකම්වරයා.

1962 සැප්තැම්බර් මස 25 වන දින,
කොළඹ දීය.

#### නම නියම කොට පත්කරනු ලබන සාමාජිකයෝ

1. ඇස්. ඒ විජේතිලක මහතා.
2. ඒ. අබේකෝන් මහතා.
3. ආචාර්‍ය වර්ණසේන රසපුත්‍රම් මහතා.

#### සේවා නියෝජිතවරු

1. ටී. ජේ. පීරිස් මහතා.
2. ජේ. අබේවික්‍රම මහතා.
3. සී. එච්.ඉසැඩ්. ප්‍රනාන්දු මහතා.
4. ආර්. එච්. ද මෙල් මහතා.
5. මෙරිල් ඒ. ප්‍රනාන්දු මහතා.
6. ආර්. ඇප්. ඇස්. ද මෙල් මහතා.

#### සේවක නියෝජිතවරු

1. ඇම් ජී. මැන්දිස් මහතා.
2. ඇස්. සියදෝරිස් මහතා.
3. වෝල්ටර් ජෝතිපාල මහතා.
4. කේ. කේ. ඇබිහිඅප්පු මහතා.
5. එච්. සී. වෙඩිවර්ධන මහතා.
6. ඒ. ඩී. රූබන් සිල්වා මහතා.

10-133

---

## ධීවර ආඥපනතේ (212 වැනි පරිච්ඡෙදය) 20 (3) වැනි වගන්තිය යටතේ කෙරෙන නිවේදනයයි

ධීවර ආඥපනතේ (212 පරිච්ඡෙදය) 20 (1) වගන්තිය ප්‍රකාර, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති ගරු සී. පී. ද සිල්වා මහතා විසින්, පුත්තලම් දිස්ත්‍රික්කයේ සින්නපාඩු හා කන්දතෝඩු වාව නමින් හැඳින්වෙන ධීවර මධ්‍යස්ථානවල පිහිටා ඇති 1 සිට 23 දක්වා වූ පාඩුවල මාදැල් අදිනු ලබන ධීවරයන් එක් අතකින් ද අනෙක් අතින් සින්නපාඩු හා කන්දතෝඩුවාව යන ධීවර මධ්‍යස්ථානවලට යාබද මුහුදෙහි මසුන් මැරීමෙහි යෙදී සිටින තෙප්පම් ධීවරයන් ද අතර මෙම ජලාශවල මසුන් මැරීමේ තම තමන්ගේ අයිතිවාසිකම් පිළිබඳව පැන නැගී ඇති ආරාවුලක් ගැන ප්‍රසිද්ධ විභාගයක් පවත්වා වාර්තා කිරීමට මට පවරා තිබේ.

2. ආරාවුලට අන්තර්ගත කරුණු මෙසේ යි :—

තමන්ගේ පාඩුවලට යාබද මුහුදෙහි මාදැල් එලීමේ තනි අයිතිය අනාදිමත් කාලයක සිට තමන් සතුව පැවති බව මාදැල් ධීවරයෝ කියා සිටිති. මෙම ජලාශවල තෙප්පම් මගින් මසුන් මැරීම නිසා තමන්ගේ ධීවර වෘත්තියට අහිතකර බලපෑමක් සිදුවන බව ඔවුන් චෝදනා කරන අතර, මාදැල් මගින් මසුන් මැරීමේ කාලය තුල මේ ජලාශයන්හි තෙප්පම් මගින් මසුන් මැරීම සම්පූර්ණයෙන්ම තහනම් කරන ලෙසට ඔව්හු ඉල්ලා සිටිති.

මෙම ජලාශවල බොහෝ කාලයක් මුළුල්ලේ පටන් මේ මාදිලියේ මසුන් මැරීමෙහි තමන් නියැලී සිටින බව ප්‍රකාශ කරන තෙප්පම් ධීවරයෝ මේ ජලාශයන්හි තමන්ගේ ධීවර කර්මාන්තයට මාදැල් ධීවරයන් විසින් බාධා පමුණුවන බව කියා සිටිති. කිසිම බාධාවක් හෝ අවහිරයක් නොමැතිව තමන්ගේ මසුන් මැරීමේ කටයුතු කර ගෙන යාමට ඉඩ දෙන ලෙස ඔව්හු ඉල්වා සිටිති.

3. දැනට ඉදිරිපත් කර තිබෙන කරුණුවලට ආරාවුල සම්බන්ධ සියලුම තොරතුරු අන්තර්ගත වී නොමැතිව තිබිය හැකි බැවින්, ඉහතින් සංක්ෂේපයෙන් සඳහන් කර තිබෙන ආරාවුලට, ආගන්තුක වූ හෝ සම්බන්ධ වූ හැම කාරණයක්ම විමසා බැලීමටත් එවැනි හැම කාරණයක් ගැනම රපෝර්තු කිරීමටත් මට පවරා තිබේ.

4. මේ ආරාවුලට සහභාගි වී ඇති හෝ ආරාවුල ගැන උනන්දුවක් දක්වන හෝ යමෙක්, ආරාවුල සම්බන්ධ කරුණු ලියැවිලි මගින් ඉදිරිපත් කිරීමට සතුටු නම්, 1962 ඔක්තෝබර් 31 වැනි ද හෝ ඊට පෙර, කොළඹ, ගාලු මුවදොර ධීවර අධ්‍යක්ෂ මහතාගේ කාර්යාලයට ලැබෙන පරිදි ඒවා එවිය යුතුයි.

5. මේ ආරාවුල සම්බන්ධ ප්‍රසිද්ධ විභාගයක් බත්තුලුඔය සංචාරක බංගලාවේදී 1962 නොවැම්බර් 7,8,9 යන දිනවල පෙරවරු 10 ට මා විසින් ආරම්භ කරනු ලැබේ.

අවශ්‍ය වුවහොත් විභාගය අවසන් වනතුරු මීට පසු දිනවලට වුවද විභාගය දීර්ඝ කරනු ලැබේ. දිවුරුම් ගැනීමෙන් පසු කට වචනයෙන් හෝ ලියැවිලි මගින් හෝ මේ විභාගයේදී ඉදිරිපත් කරන සාක්ෂි මා විසින් අසනු ලැබේ. කලින් ඉදිරිපත් කර ඇති කරුණු ඔප්පු කිරීම සඳහා සාක්ෂි දීමට යැයි නියම කර ඇති සියලු දෙනාටම ඔවුන් විසින්ම හෝ කිසියම් මිත්‍රයකු මගින් හෝ නීතිඥයකු මගින් මෙදින සාක්ෂි ඉදිරිපත් කළ හැක.

සිරිල් වැන් ලැන්ගන්බර්ග්.

1962 ඔක්තෝම්බර් 1 වැනිදා,
රාජගිරියේ, නාවල පාරේ,
අංක 363 දීය.

10-193

---

## දැන්වීමයි

### චිත්‍රපටි කොමිෂන් සභාව

පහත සඳහන් කරුණු ගැන සොයා බලා වාර්තා කිරීම සඳහා මෙම කොමිෂන් සභාව අතිගරු අග්‍රාණ්ඩුකාරතුමා විසින් පත්කොට තිබේ :—

(1) රජයෙන් දේශීය චිත්‍රපටි කර්මාන්තයට කෙළින්ම ආධාර කළ යුතු පිළිවෙල.

(2) ලංකාවේ තිබෙන චිත්‍රාගාර පහසුකම් ප්‍රමාණවත් ද, නැත් ද, යන්න වඩාත් හොඳට සහ ලාභයට ලංකාවේ චිත්‍රපටි නිපද විය හැකි පිළිවෙල හා රජයේ චිත්‍රපටි අංශයේ අනාගතය කුමක් විය යුතුද යන්න.

(3) චිත්‍රපටි බෙදා හරින්නා විසින් නිෂ්පාදකයාට නිසි ලාබ ලබා නොදීම වලක්වනු පිණිස බෙදා හරින්නා හා නිෂ්පාදකයා අතර තිබිය යුතු නියම සම්බන්ධතාව.

(4) දේශීය චිත්‍රපටිවල තත්ත්වය උසස් කිරීමට ගත යුතු පියවර.

(5) රචකයන්ට අනුබල දිය යුතු අන්දම හා නළු නිළියන් හා කාර්මිකයන්ට පුහුණුවක් ලබා දිය යුතු පිළිවෙල.

(6) විදේශීය චිත්‍රපටි මෙරටට ගෙන්වීම සඳහා සංස්ථාවක් පිහිටු වීම.

2. මෙම කොමිෂන් සභාව ඉදිරියේ කරුණු ප්‍රකාශ කිරීමට කැමති සෑම අයෙක් ම මා වෙත එම කරුණු 1962 ඔක්තෝබර් 31 වැනි දිනට පෙර ලියා දැන්විය යුතුයි. එම කරුණු සනාථ කිරීම සඳහා කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිට සාක්ෂි දීමට කැමති ද යන වගත්, ඔවුන් විසින් දැන්විය යුතු යි.

3. එම අයගෙන් සාක්ෂි ඇසීමට කොමිෂන් සභාව තීරණය කළ හොත් ඒ බව යථා කාලයේ දී ඔවුන් වෙත දන්වා යවනු ලැබේ.

ඩබ්ලිව්. ආර්. බී. රාජකරුණා,
චිත්‍රපටි කොමිෂන් සභාවේ ලේකම්.

කර්මාන්ත, ස්වදේශ හා සංස්කෘතික
කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
කොළඹ 7,
1962 ඔක්තෝබර් මස 1 වැනි දින දී ය.

10-205

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## අනුරාධපුර දිස්ත්‍රික්කයේ තුවක්කු බලපත්‍ර 1963 අවුරුද්ද සඳහා අළුත්වැඩියා කිරීම

අනුරාධපුර දිස්ත්‍රික්කයේ, අනුරාධපුර නගර සීමාවෙන් පිට, වර්ෂ 1963 අවුරුද්දට තුවක්කු බලපත්‍ර අළුත්වැඩියා කිරීම, ආදායම් පාලක නිලධාරිතුමන්ගේ ඒ ඒ කායඞාලවලදී 1962 කේ නොවැම්බර් මස 1 වෙනි දින පටන් ගනු ලැබේ. නගර සීමාව තුල තිබෙන සියළුම තුවක්කු අළුත්වැඩියා කිරීම එම දින සිට අනුරාධපුර කච්චේරියේදී පටන් ගනු ලැබේ.

2. තුවක්කුවක් සඳහා දී ඇති සෑම බලපත්‍රයක්ම 1962 දෙසැම්බර් මස 31 වෙනිදාට පෙර 1963 අවුරුද්ද සඳහා අළුත් කර ගන්නා ලෙස අවවාද වශයෙන් මහජනයාට දන්වනු ලැබේ. බලපත්‍ර අළුත් කිරීමේදී පරණ බලපත්‍ර සෝදිසි කිරීම පිණිස එම තුවක්කුද ඒ ඒ නිලධාරි වෙත ඉදිරිපත් කළ යුතුය.

3. යමෙකු 1962 දෙසැම්බර් මස 31 වන දිනට ප්‍රථම බලපත්‍ර අළුත් කර නොගතහොත් එවැනි බලපත්‍රයක් නියමිත කාලයෙන් පසුව අළුත් කිරීමේදී බලපත්‍ර ගාස්තු මුදලින් සියයක අතිරේක දඩ මුදලක් ගෙවා අළුත් කර ගන්නට සිදුවේ. යම්කිසි හේතුවක් නිසා බලපත්‍රයක් අළුත් කර නොගන්නේ නම් එම බලපත්‍රය ද, තුවක්කුවද බලපත්‍ර නිකුත් කරන නිලධාරි වෙත 1962 දෙසැම්බර් මස 31 වන දින හෝ ඊට පෙර භාරදිය යුතුය.

4. 1962 වර්ෂයට නිකුත් කරන ලද තුවක්කු බලපත්‍රයක්, බලපත්‍ර නිකුත් කරන නිලධාරි තැනට භාරදීම පිණිස යමෙකු ලඟ නොමැති නම්, එවැනි බලපත්‍රයක සහතික පිටපතක් සඳහා නියමිත බලපත්‍ර ගාස්තුවට තවත් වැඩිපුර රුපියලක් ද ගෙවන්නට සිදුවේ.

5. 1963 මාර්තු 31 වන දිනට ප්‍රථම තුවක්කු බලපත්‍ර අළුත් කර නොගන්නා අයට විරුද්ධව නඩු පවරන බව ද සැලකිය යුතුය.

මෙයට,

ඒ. ආ. ගුණරත්න,
අනුරාධපුර දිසාපති,
බලපත්‍ර නිකුත්කිරීමේ බලයලත් නිලධාරි.

1962 සැප්තැම්බර් මස 25 වන දින.
අනුරාධපුර දිසාපති කායඞාලයයේදීය.

10-121

ඇල්.ඕ.—බී. 23/50

### උකස් පනත

වාණිජ අධ්‍යක්ෂ, ගිනිගේ රිචර්ඩ් වෝල්ටර් ද සිල්වා වන මම (89 අධිකාරය වන) උකස් පනතේ අංක 3 (ඇ) සහ 114(2) දරන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සීමාසහිත ද සෙන්ට්‍රල් පිනෑන්ස් සමාගම, එම පනතේ කාර්යයන් සඳහා පිළිගත් ණයදෙන ව්‍යාපාරයක් වශයෙන් මෙම නිවේදනයෙන් ප්‍රකාශයට පමුණුවා සිටිමි.

ජී. ආර්. ඩබ්ලිව් ද සිල්වා,
වාණිජ අධ්‍යක්ෂ.

1962 සැප්තැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

10-9

### ප්‍රකාශනයයි

වයඹ පළාතේ හලාවත දිස්ත්‍රික්කයේ පිටිගල් කෝරළේ උතුර කරවන ආදායම් පාලක නිලධාරී කොට්ඨාශයේ ගවයින් අතර "මුව සහ කුර" නමැති රෝගය පැතිරී යන බැවින්, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී තැන්පත් අබේරත්න බණ්ඩාරනායක වන මම 1957 අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥපනතේ 327 වැනි පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ 1 වැනි අතුරු වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව පහත සඳහන් සීමා ඇතුළත පිහිටි ප්‍රදේශය බෝවෙන රෝග ඇති ප්‍රදේශයක් කොට සලකනු ලබන බව මෙයින් ප්‍රකාශ කරමි.

උතුරට : පුත්තලම් දිස්ත්‍රික්කය ; දකුණට : කඩුපිටි ඔය ; නැගෙනහිරට : කුරුණෑගල දිස්ත්‍රික්කය ; බස්නාහිරට : මුහුද.

2. මෙම ආඥපනතේ 7 වැනි වගන්තියේ ප්‍රකාර, තහනම් කරන ලද, ඉහත සඳහන් සීමා ඇතුළත ප්‍රදේශයට හෝ ඉන් පිටතට ගව යන් හෝ ගවයන් බඳිනාලද වාහන හෝ මෙම දැන්වීම මා විසින් අවලංගු කරන තෙක් ගෙන යෑම තහනම් කරමි.

3. තවද, 1937 දී සම්මත කරන ලද "සතුන්ගේ බෝවෙන රෝග" පිළිබඳ නීති මාලාව අනුව තහනම් කරන ලද ප්‍රදේශයක ඒ ඒ නිලධාරීන් විසින් නීත්‍යානුකූලව ක්‍රියා කරන අයුරු ගව හිමියන් හා කිරත්ත කරුවන් වෙත මෙයින් සිහිපත් කරවන අතර, එම නීති රීති සම්බන්ධව වැඩි විස්තර හලාවත පශු වෛද්‍ය තැනගෙන් හෝ පිටිගල් කෝරළේ උතුර කරවන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරී තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකි බව මෙයින් වැඩිදුරටත් දන්වමි.

4. මෙම ප්‍රකාශනය අද දින පටන් වළංගු වන බව දත යුතුයි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරී තැන.

1962 සැප්තැම්බර 28 වැනි දින,
පේරාදෙනියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය
නිලධාරීගේ කායඞාලයේ දී ය.

10-144

### දැන්වීමයි

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ කරච්චි-තුනුක්කායි කරවන ආදායම් පාලක නිලධාරි කොට්ඨාශයේ මුරාසුමුඩයි සහ රාමනාද පුරම් ගම්වල ගවයින් අතර "බ්ලැක් ක්වාටර්" නමැති රෝගය පැතිරී යන බැව් 1957තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥපනතේ 327 පරිච්ඡෙදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වර්ෂ 1962.7.27 දින අංක 13,230 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවළංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිළධාරි.

1962 සැප්තැම්බර 24 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය කාර්යාලයේදීය.

10-45

## දැන්වීමයි

උතුරු පළාතේ යාපනය දිස්ත්‍රික්කයේ පූනේරියන් කරවන ආදායම් පාලක නිළධාරි කොට්ඨාශයේ ගවයින් අතර, "බ්ලැක් ක්වාටර්" නමැති රෝගය පැතිරී යන බැව් 1957තේ අංක 33 දරණ (සතුන්ගේ) බෝවෙන රෝග සම්බන්ධ (සංශෝධිත) ආඥපනතේ 327 පරිච්ඡේදයේ 4 වැනි වගන්තියේ (1) අතුරු වගන්තිය යටතේ මා විසින් වර්ෂ 1962.8.17 දින අංක 13,263 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද දැන්වීම අද දින සිට අවලංගු වන බව මහජනයාට මෙයින් දැනුම් දෙමි.

අබේරත්න බණ්ඩාරනායක,
රජයේ ප්‍රධාන පශු වෛද්‍ය නිළධාරි.

1962 සැප්තැම්බර 24 වැනි දින,
පේරාදෙණියේ, රජයේ ප්‍රධාන පශු වෛද්‍ය කාර්යාලයේදීය.

10-46

---

## ආණ්ඩුවේ නිවේදනය

**ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ, කන්කසන්තුරේ මාර්ගයේ සිට මයිලෙඩ්ඩි දක්වා යාපනේ දුම්රිය මාර්ගයේ, සැතපුම් 255, දම්වැල් 10 යේ, මාවිද්දපුරම් දුම්රිය නැවතුම්පොල අසල තිබෙන මාවිද්දපුරම් දුම්රිය හරස් මාර්ගයේ රථවාහන ගමනාගමන පාලනය**

1962 සැප්තැම්බර් මස 30 වැනි ඉරුදින සිට ඉහත කී ආරක්ෂා රහිත දුම්රිය හරස් මාර්ගයේ සවිකරන ලද ත්‍රිත්ව වර්ණාලෝක සංඥ දෙකකින් හා වෙනම කනුවල සවිකරන ලද අනතුරු හැඟවීමේ සීනුවලින් යථා ස්ථානයේදීම රථවාහන ගමනාගමනය පාලනය වේ. සැම රථවාහනවලම රියැදුරන් පහත දක්වන ක්‍රමය අනුව ක්‍රියාවේ යෙදෙන වර්ණාලෝක සංඥවන් පිළිපැදිය යුතුය.

1. දුම්රිය හරස් මාර්ගයේ දෙපස, වර්ණාලෝක සංඥ වලට අඩි 10 කට ඉදිරියෙන් "නවතිනු" යන්න හැඟවීමේ සුදු ඉරක් මහා මාර්ගයේ වර්ණාලෝක සංඥවලට අමතරව පාර හරහා සලකුනු කර ඇත.

2. දුම්රිය මාර්ගයේ දෙපස අඩි 30කට ඈතින් එකක් රතු ද, එකක් කහ ද, එකක් කොළ පාටින් ද යුත් විදුලි ලාම්පු තුනකින් සමන්විත වූ වර්ණාලෝක සංඥ පුවරු, සංඥවෙන් පාලනය කිරීමට බලාපොරොත්තු වන රථවාහන ගමන්කරන දිසාවට මුහුන ලා පාරේ වම් පැත්තේ සිටුවා ඇත.

3. ලාම්පුවල වර්ණාලෝක සංඥ කෙලින් සවිකර ඇත. රතු එළිය ඉහලින්මද, කොළ පාට එළිය පහලින්මද වේ.

4. රථවාහන ගමනාගමනය පාලනය සඳහා සංඥ එළි ක්‍රමය පහත සඳහන් අන්දමට යොදා ඇත:—

(ඒ) රතු ("STOP" යන වචනය ලාම්පු වීදුරුවේ සඳහන්ව.)

(බී) කහ පාට සහ රතු පාට එකට.

(සී) කොල ("GO" යන වචනය ලාම්පු වීදුරුවේ සඳහන්ව.)

(ඩී) කහ තත්පර 5 කට පසු රත ට වෙනස්වීම ("ඒ" මෙනි)

5. ඉහත කී වර්ණාලෝක සංඥවල ක්‍රියාකාරීත්වය මෙසේය:—

(ඒ) රතු සංඥවෙන් හඟවන්නේ දුම්රියක් හරස් මාර්ගය වෙත එන බවත් එය යාර 300 ක් ඈතුලත බවත් ය. කිසිම රථවාහනයක් කොල පාට එළිය දැක්වෙන තුරු "නවතිනු" යන්න හඟවන ඉරෙන් එහාට නොයා යුතුයි.

(බී) කහ සමග රතු සංඥවෙන් හඟවන්නේ රතෙන් කොලපාටට බලාපොරොත්තු වන වෙනසකි. නමුත් රතු සංඥවෙන් දැක්වෙන තහනම මෙයින් ඉවත් නොවේ.

(සී) කොලපාට සංඥවෙන් හඟවන්නේ මහා මාර්ගයේ පාවිච්චි කරන අනිකුත් අයගේ ප්‍රවේසම ගැන විශේෂ සැලකිල්ලෙන් හා යම් විටෙක පොලිස් නිලධාරියෙක් හෝ ගමනාගමන පාලනය පිළිබඳව බලය ලත් වෙනත් අයෙකුගේ නියෝගයනට යටත්ව කෙළින්ම සංඥව පසුකර ගමන් කිරීමයි.

(ඩී) කහ සංඥවෙන් පමණක් හඟවන්නේ දුම්රියක් යාර 350 කට ඈතින් සිට හරස් මාර්ගය වෙත ගමන් කරණ බවත්, සංඥව රතුපාටට වෙනස් වීමේ බලාපොරොත්තුව නිසා, සියළුම රථවාහන "නවතිනු" යන්න හඟවන ඉරෙන් එහාට පැදවීම තහනම් බවත් ය.

6. සංඥවේ කහ හෝ රත තිබියදී, හෝ කහ සහ රත තිබියදී, නොකඩවා නාදවෙන අනතුරු හැඟවීමේ සීනුව, ඇසට පෙනෙන සංඥවට අමතරව කනට ලැබෙන සංඥාවෙකි.

7. මොනයම් අවස්ථාවකදී හෝ මෙම වර්ණාලෝක සංඥ ක්‍රියාවිරහිත වුවහොත්, රථවාහනවල සියළුම රියැදුරන් ප්‍රවේසමෙන් හරස් පාර හරහා රිය පැදවිය යුතු අතර අතින් දෙන සංඥවක් වේනොත් එයද පිළිපැදිය යුතුය.

10-15

සැම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සැම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දයකමුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දයකමුදල් භාරගනු නොලැබේ.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණු ලබන ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරණු ලැබේ)

1\. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2\. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3\. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4\. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5\. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නාමට එවිය යුතුයි.

6\. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7\. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8\. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරණු නොලැබේ.

9\. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතාගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරණු නො ලැබේ.

10\. 1962 ජූලි මස 16 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණ ගාස්තු මෙසේයි :—

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 10 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 110 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 220 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුව අය කරණු ලැබේ.

11\. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12\. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

13\. දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. ශ. | | පිටරට රු. ශ. |
|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 22 50 | ... | 35 50 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 12 50 | ... | 18 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 20 0 | ... | 28 0 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නොඅඩු කාලයකට පමණය.**

**තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. ශ. | | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|---|
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී එක කොටසක් ... ... ... | 0 25 | ... | 0 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක් ... ... ... | 0 50 | ... | 0 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුලත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 10 | ... | 0 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 0 20 | ... | 0 15 |

**දායක මුදල් භාරගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණපිතාහි